

# සමාජ අන්තර්කරණය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමට බැඳෙන ආකාරය

**SIAGට බැඳීමට කැමැත්ත ප්‍රකාශ කිරීමේ දිනය 2025 සැප්තැම්බර් 19 වන දිනෙන් අවසන් වේ.**

## සමාජ අන්තර්කරණය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම යනු කුමක්ද?

The City of Whittlesea (විට්ල්සී නගරය), ප්‍රාන්ත රජයේ උපකාරය ඇතිව, සමාජ අන්තර්කරණය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම(SIAG) යනුවෙන් හැඳින්වෙන නව කණ්ඩායමක් ආරම්භ කරයි.

මෙම කණ්ඩායම සමාජ අන්තර්කරණය සහ සම්බන්ධතාව පිළිබඳ අවධානය යොමු කරයි. එමගින්,පුද්ගලයන් ප්‍රජා ජීවිතයට සහභාගී වෙමින්, ඔවුන් ඇත්තෙන්ම එම ජීවිතයට අයත් වන බවට හැඟීමක් ඇති වීම පහසු කළ හැකි ක්‍රම ගවේශනය කරයි.

වඩාත් අවශ්‍ය වන්නේ කුමක්ද යන්න අවබෝධ කර ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශ SIAG ට ප්‍රජාවේ සාක්ෂි සහ අදහස් මගින් ලබා දෙනු ඇත. ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කර, පුද්ගලයන් එක් වීම වැඩි කිරීමට ප්‍රජා නායකත්ව ව්‍යාපෘතිවලට උපරිම ලෙස සහාය වන්නේ කෙසේද යන්න එය ඉන් අනතුරුව තීරණය කරනු ඇත.

වෙනස් හඬවල් ඇසන බවට සහතික වීම පිණිස විවිධ පසුබිම්වලින් පැමිණෙන පුද්ගලයන් 12-14ක් කණ්ඩායමට ඇතුළත් කෙරෙනු ඇත. ආරක්ෂිත සහ ගරුත්වයෙන් යුතු ස්ථානයක් නිර්මාණය කිරීමට අපි ඇප කැප වී සිටිමු.

## මා ඉල්ලුම් කළ යුතුද?

විවිධ හැකියාවන්, ආකල්ප ඇති, එකිනෙකාගෙන් ඉගෙන ගැනීමට උනන්දු වන පුද්ගලයන් අපි සොයමු. The City of Whittlesea (විට්ල්සී නගරයෙහි) SIAG පහත සඳහන් පුද්ගලයින්ගේ එකතුවක් වනු ඇත:

- අවුරුදු 18ක් හෝ ඊට වැඩි
- නාගරිකයේ සියලු ප්‍රදේශවල ජීවත්වන සහ වැඩ කරන
- විවිධ ජන කණ්ඩායම් සමග හොඳින් සම්බන්ධ වී සිටින
- ආබාධ සහිත, LGBTQIA+, ස්වදේශික ප්‍රජාව සහ බහු සංස්කෘතික සහ සරණාගත ප්‍රජාවන්ට අයත් වන කණ්ඩායම්
- මානසික සෞඛ්‍යමය අභියෝග, නිවාස නොමැතිකම, විරැකියාව, පවුල් ප්‍රචණ්ඩත්වය, තනි මවක හෝ පියකු වීම , පවුලේ අයකු රැක බලා ගන්නකු වීම හෝ අන්තර්කරණය පිළිබඳ හැඟීමට බලපෑමක් විය හැකි වෙනත් අවස්ථා ඇතුළත් දුෂ්කරතා හෝ අහිතකර තත්ත්වයන් අත්දැක තිබීම

නාගරික මන්ත්‍රීවරුන්ට සහ The City of Whittlesea (විට්ල්සී නගරයෙහි) කාර්ය මණ්ඩලයට අයදුම් කළ නොහැක.

Interpreter
Free telephone interpreter service
131 450

City of Whittlesea

VICTORIA State Government

## මා කළ යුත්තේ කුමක්ද?

- ඔබේ අත්දැකීම්, ප්‍රජා දැනුම සහ ප්‍රාදේශීය සම්බන්ධතා ජාල බෙදා හදා ගැනීම
- සමාජ අන්තර්කරණය සහ සම්බන්ධවීම පිළිබඳ ප්‍රාදේශීය අවශ්‍යතා, පවත්නා සමාරම්භකයන් සහ හිදැස් හඳුනා ගැනීමට උපකාරී වීම
- අරමුදල් භාවිතා කරන ආකාරය තීරණය කිරීමට අනෙකුත් SIAG සාමාජිකයන් සමග එකට වැඩ කිරීම
- තොරතුරු බෙදා හදා ගැනීමට සහ නව අදහස් සම්බන්ධීරණය කිරීමට පුළුල් ප්‍රජා කොටසක් සමග සම්බන්ධ වීම
- දැනුම සහ හැකියාවන් ගොඩ නැගීමට පුහුණුව ලබා ගැනීම සහ ඔබේ සහභාගීත්වය වෙනුවෙන් ගෙවීමක් ලබා ගැනීමට

## මා කැප වන්නේ කුමකටද?

මාස 18 කාලයකට SIAGහි කොටසක් වීමට

- 2025 ඔක්තෝබර් සිට දෙසැම්බර් මුල භාගය දක්වා සහ, 2026 ජනවාරි මැද සිට අප්‍රේල් දක්වා දෙසතියකට වරක්ද ඉන්පසුව, 2026 මැයි සිට මාසිකවද රැස්වීම්වලට සහභාගී වීමට
- ඉගෙනුම් සහ හැකියා ගොඩ නගා ගැනීම සඳහා වන පුහුණු සැසිවලට (රැස්වීම් කාලය ඇතුළත) සහභාගී වීම
- SIAG වැඩ ප්‍රවර්ධනය කිරීමට හැකි විට ප්‍රජා වැඩසටහන්වලට සහභාගී වීම
- සහෝදර සාමාජිකයන් සමග ඉගෙන ගැනීමට සහ වැඩ කිරීමට කැමැත්තක් තිබීම



## අප හමුවන්නේ කවදාද?

කණ්ඩායම් සාමාජිකයන්ට පැමිණිය හැකි ආකාරය අනුව, අඟහරුවාදා හෝ බ්‍රහස්පතින්දා දිනවල SIAG රැස්වීම් පැවැත්වෙනු ඇත. එක් එක් රැස්වීම් විනාඩි 90ක් හෝ පැය 2ක කාලයක් තුළ පැවැත්වෙනු ඇත.

රැස්වීම් ස්ථානය පිළිබඳ විකල්ප ලබා දෙන අතර සාමාජිකයන්ට ඔවුන් හමුවන තැන එක්ව තෝරා ගත හැක. සියලු ස්ථානවලට ආබාධිතයින්හට ප්‍රවේශතාව තිබේ. ප්‍රවේශ වීමේ සහාය අවශ්‍ය අයට එය ලබා දෙනු ඇත.

## මට ලැබෙන්නේ මොනවාද?

කණ්ඩායම් සාමාජිකයන්ට සිය කුසලතා සහ දායකත්වය අගය කිරීම සඳහා රැස්වීම්වලට සහ පුහුණු සැසිවලට සහභාගී වීම වෙනුවෙන් ගෙවීමක් ලැබෙනු ඇත. සාමාජිකයන්ගේ සහභාගීත්වයට උපකාරී වේ නම් ගමන්, භාෂණ පරිවර්තකයන්/භාෂා පරිවර්තකයින් සහ ළමා සුරැකුම් වැනි වියදම් සඳහා වන පිරිවැයද ආවරණය කෙරෙනු ඇත.

## මට අයදුම් කළ හැක්කේ කෙසේද?

QR කේතය ස්කෑන් කරන්න

SIAG සාමජිකයෙකු වීමට ඔබගේ ඇති කැමැත්ත ප්‍රකාශ කිරීමට, ඔබට **engage.whittlesea.vic.gov.au/siag** හි ඇති මාර්ගස්ත අයදුම්පත සම්පූර්ණ කළ හැකිය.

### ඔබට පහත දේවල්ද සිදු කිරීම තෝරා ගත හැකිය:

- නගර සභාවෙන් ලබා ගත් සම්පූර්ණ කරන ලද මුද්‍රිත පිටපත ඉදිරිපත් කිරීම
- ප්‍රධාන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන කෙටි වීඩියෝවක් උඩුගත කිරීම
- SIAG සම්බන්ධීකාරක හෝ ව්‍යාපෘති නිලධාරියෙකු සමඟ විනාඩි-10 සංවාදයක් සඳහා දුරකථන ඇමතුමක් ලබා දීම

ඔබ ඉහත විකල්පවලින් එකකට කැමති නම්, එසේ නැතහොත් භාෂණ පරිවර්තකයෙකු අවශ්‍ය නම් හෝ අයදුම් කිරීම සඳහා ගැලපුම් අවශ්‍ය නම්, කරුණාකර විකල්ප සාකච්ඡා කිරීමට **SIAG@whittlesea.vic.gov.au** වෙත යන්න එසේ නැතහොත් **9407 5907** අමතන්න.

Interpreter
Free telephone interpreter service
131 450

City of Whittlesea

VICTORIA State Government